මගේ අංකය :1/11/2/4/1

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
පේරාදෙණිය.
27-10-2022

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ / සංවර්ධන)
අධ්‍යක්ෂ (සංවර්ධන I) / (සංවර්ධන II) /(සංවර්ධන III) / (නියාමන) / (විශේෂ පර්යේෂණ)
පර්යේෂණ මධ්‍යස්ථාන භාර අධ්‍යක්ෂ
උප පර්යේෂණ මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම**

මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සම්බන්ධ අයදුම්පත් කැඳවීමේ නිවේදනය සහ අයදුම්පත මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.

02. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ සේවය කරන නියමිත සුදුසුකම් සහිත 1 වැනි පන්තියේ ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ නිලධාරීන් විසින් සම්පූර්ණ කර ලබා දෙනු ලබන අයදුම්පත් ඔබගේ නිර්දේශය සහිතව **2022.11.11** දිනට ප්‍රථම මා වෙත යොමු කරන ලෙසත්, කාරුණිකව දන්වමි.

ඒ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

ඒ.පී.පී. දිස්නා
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්


දුරකතන - 081 2388364
ෆැක්ස් - 081 2388738
විද්‍යුත් ලිපිනය - addivexportagri@gmail.com

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.</u>

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2020.12.31 දිනට පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරි තනතුරු 11 ක් සේවා පළපුරුද්ද හා කුසලතාවය පදනම් කර ගෙන පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන පන්තියේ ව්‍යාප්ති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 (MN-7) අනුව, රු. 41, 580 -11 X 755 -18 X 1030 - 68, 425/- ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

03. ඒ අනුව, පහත සඳහන් සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් වෙතොත් මේ සමඟ අමුණා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව සකස් කළ ඉල්ලුම්පත් ඔබගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා මඟින් **2022.11.11** දිනට පෙර "අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1095, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**04. සුදුසුකම්:-**

**4.1 පළපුරුද්ද :-**

අයදුම්පත් කැඳවන දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-3) සේවා ගණයේ ව්‍යාප්ති නිලධාරි තනතුරේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

**4.2 වෙනත් :-**

- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
- අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව, අයදුම්පත් කැඳවීමේ දිනයට පෙරාතුව වූ වසර හය (06) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
- නව තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට එනම් 2013.06.01 දිනට 1 ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් III වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

**4.3 කායික සුදුසුකම් :-**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බලා ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සඳහා පහත දැක්වෙන ආකාරයට ලබා දෙන ලකුණු වල අනුපිළිවෙල අනුගමනය කිරීමෙන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය.**

| ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර හා උපරිම ලකුණු | ලකුණු ලබා දීමේ ක්‍රමය | ලකුණු |
|---|---|---|
| 1.අතිරේක සේවා පල පුරුද්ද<br>උපරිම ලකුණු<br>50 | ➢ **වසරකට හිමි වන උපරිම ලකුණු ප්‍රමාණය.**<br>➢ **අවුරුද්දට අඩු හා මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා හිමි වන ලකුණු ප්‍රමාණය.**<br>( මාස 06 ට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)<br>**සටහන :-** අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2022.11.11** ලෙස සලකා ගණනය කිරීම් සිදු කර ඇත. සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට එනම් 1 වන පන්තියේ වසර හය (06) ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනයේ සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා 1 වන පන්තියේ සේවා කාලය සලකා ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වය පිළිබිඹු වන ආකාරයට ගණනය කිරීම් සිදු කරනු ලැබේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලයට අමතරව වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට එම ලකුණු ප්‍රමාණයට සමානුපාතික වන ලෙස ඔවුන්ගේ අමතර සේවා කාලයන් සඳහා ගණනය කරන ලද ලකුණු ප්‍රමාණයක් ද ලබාදෙනු ලැබේ.<br>(උපරිම සේවා කාලය වසර 21 කි) | 2.38<br>1.19 |
| 2. කුසලතාවය සඳහා<br>උපරිම ලකුණු<br>45 | ➢ **වෘත්තීය සහ අධ්‍යාපන සුදුසුකම්**<br>සේවයට බඳවා ගන්නා ලද මූලික සුදුසුකම් හැර ලබා ඇති අනෙකුත් වෘත්තීය සහ අධ්‍යාපන සුදුසුකම් සලකා බැලේ. (කෘෂිකර්ම, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ඉංග්‍රීසි භාෂාව, පරිගණක, ගණකාධිකරණය, ජනසන්නිවේදනය, ව්‍යාපෘති කළමනාකරණය, අලෙවි කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබාදේ.) (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.)<br>• සහතික පත්‍ර (සේවාස්ථ පුහුණු හැර) - 02<br>• ඩිප්ලෝමා - 03<br>• උපාධිය (ක්ෂේත්‍රයක් සලකා නොබැලේ) - 05 | උපරිම ලකුණු<br>05 |
| | ➢ රැකියා ක්ෂේත්‍රයට අදාලව ආයතනගතව/ ජාතික හෝ අන්තර් ජාතික වශයෙන් ප්‍රකාශන, අත්පොත්, ලිපි එළිදැක්වීම *.<br>(එකකට ලකුණු 02 බැගින්) | 10 |
| | ➢ රැකියා ක්ෂේත්‍රයට අදාලව විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම *. (එකකට ලකුණු 03 බැගින්) | 15 |
| | ➢ ක්ෂේත්‍රයට අදාලව දේශීය පුහුණු වැඩ සටහන් සඳහා සහභාගී වීම*. (පුහුණු එකකට ලකුණු 01 බැගින්) | 05 |
| | ➢ ක්ෂේත්‍රයට අදාල පුහුණු වැඩ සටහන්වලට සම්පත් දායකත්වය ලබා දීම*. (එකකට ලකුණු 01 බැගින්) | 05 |
| | ➢ සේවා කාලය තුල ලැබී ඇති ප්‍රසංසනාත්මක ලිපි/ සම්මාන (සේවා කාලය තුල පොදු 230 "ආ" ආකෘතියට අනුකූලව ලබා දී ඇති ප්‍රසංසාත්මක ලිපි පමණක් සලකා බලන අතර, එක් ලිපියකට ලකුණු 01 බැගින්) | 05 |
| 03. සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම.<br>උපරිම ලකුණු<br>05 | පෞරුෂය. සන්නිවේදන හැකියාව, ඉදිරිපත් කිරීමේ හැකියාව,ආදිය සලකා බැලේ. | 05 |
| *සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කරන ලිපි/ ලේඛන ඉදිරිපත් කළ යුතුය. | | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

දිනය :-2022.10. 27

ඊ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
පේරාදෙණිය

ඊ.පී.පී. දිස්නා,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

**<u>අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 වෙනි ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත.</u>**

1. අයදුම්කරුගේ නම :-

2. ලිපිනය :-

   පෞද්ගලික :-

   රාජකාරී :-

3. දුරකථන අංකය :-
4. ස්ත්‍රී / පුරුෂ භාවය :-

5. ව්‍යාප්ති නිලධාරී තනතුරට පත් වූ දිනය :-

6. 1 වැනි පන්තියේ ව්‍යාප්ති නිලධාරී තනතුරට අන්තර්ග්‍රහනය කළ හෝ උසස් කළ දිනය:- }

7. 1 වැනි පන්තියේ වසර 06 ක සේවා කාලය සම්පූර්ණ කරන ලද දිනය:- }

8. සේවා කාලය තුල ලබා ගෙන ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :- }

9. ඔබ කිසියම් විනය දඬුවමකට භාජනය වී ඇද්ද යන වග? :-

10. දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේද යන වග :-

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

දිනය :- ................................ අයදුම්කරුගේ අත්සන:- ........................................

.............................................................................................................ගේ අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු / ඇය ................................................................................... වශයෙන් සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ වැඩ, හැසිරීම් හා පැමිණීම සතුටුදායක / අසතුටුදායක බවත්, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ කිසිවක් ඇති / නැති බවත්, මෙයින් සහතික කරමි.

දිනය:- ................................................

.............................................................
ඒකක ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)